# මාධ්‍ය නිවේදනය

## <u>පාසල්වලට සිසුන් තෝරා ගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට</u>
## <u>5 ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2023</u>

## <u>ප්‍රතිඵල නිකුත් කිරීම.</u>

2023 ඔක්තෝබර් මස 15 වන දින පැවති උක්ත විභාගයේ ප්‍රතිඵල 2023 නොවැම්බර් මස 16 වන දින නිකුත් කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

- අයදුම් කළ ශිෂ්‍ය සංඛ්‍යාව - 338037
- පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව - 332949
- කඩඉම් ලකුණෙන් ඉහළ ශිෂ්‍ය සංඛ්‍යාව - 50664

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවි වන **www.doenets.lk** හෝ **www.results.exams.gov.lk** වෙත පිවිස ප්‍රතිඵල ලබා ගත හැකිය.

❖ විභාග අයදුම්කරුගේ නිවැරදි විභාග අංකය ඇතුළත් කිරීමෙන් ප්‍රතිඵල නිරීක්ෂණය කළ හැකි අතර, අදාළ විභාග ප්‍රතිඵල සටහන බාගත කර මුද්‍රිත පිටපතක් ලබා ගැනීමට ද පහසුකම් සලසා ඇත.

❖ ශිෂ්‍යාධාර ලබා දෙන සිසුන් සංඛ්‍යාව 20,000 ක් වන අතර, ඒ අතුරින් ශිෂ්‍යත්ව 250 ක් විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා වෙන් කර ඇත.

❖ ප්‍රතිඵල සකස් කිරීමේ දී **දිස්ත්‍රික් තරාව (District Rank)** හෝ **දිවයින් තරාව (Island Rank)** නිකුත් කරනු **නොලැබේ.**

❖ ප්‍රතිඵල නිකුත් කිරීමේ දී අපේක්ෂකයා ලබා ගත් මුළු ලකුණු සංඛ්‍යාව දිස්ත්‍රික්කය හා මාධ්‍යය අනුව අදාළ කඩඉම් ලකුණු සමඟ සඳහන් කෙරේ.

❖ විශේෂ අවශ්‍යතා කාණ්ඩය යටතේ ශිෂ්‍යත්ව හිමිකම් ලබන අපේක්ෂකයින්ගේ මුළු ලකුණු සමඟ ශිෂ්‍යත්ව හිමිකම් ලැබූ බවට විශේෂ සටහනක් ඇතුළත් කෙරේ.

02. ප්‍රතිඵල නිකුත් කර පැය 24 කට පසුව සියලු ම විදුහල්පතිවරුන් වෙත අයදුම්පත් එවීම සඳහා දැනටමත් ලබා දී ඇති පරිශීලක නාම (User Name) සහ මුරපද (Password) භාවිත කර අදාළ පාසලේ විභාග ප්‍රතිඵල ලේඛනය බාගත කර මුද්‍රිත පිටපතක් ලබා ගැනීමට පහසුකම් සලසා ඇත. අපේක්ෂකයන්ගේ කේවල සහතිකපත් ප්‍රතිඵල නැවත සමීක්ෂණයෙන් පසු පාසල් වෙත තැපැල් මගින් යොමු කරනු ලැබේ.

➢ **<u>https://onlineexams.gov.lk./eic</u>** හි School Account Login හරහා ප්‍රවේශවන්න.

03. ප්‍රතිඵල නිකුත් කර පැය 24 කට පසුව සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ලබා දී ඇති පරිශීලක නාම (User Name) සහ මුරපද (Password) භාවිත කර තම පළාතේ/කලාපයේ සියලු පාසල්වල ප්‍රතිඵල බාගත කර ගැනීම සඳහා පහසුකම් සලසා ඇත.

➢ **<u>https://onlineexams.gov.lk./onlineapps</u>** හි Exam Result Sheets මත Click කරන්න.

04. කිසියම් සිසුවෙකුගේ ලකුණු පිළිබඳව නැවත පරීක්ෂාවක් සිදු කිරීමට අවශ්‍ය වන්නේ නම්, 2023 නොවැම්බර් මස 27 වන දින සිට 2023 දෙසැම්බර් මස 04 වන දින දක්වා මාර්ගගතව අභියාචනා ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.

**විමසීම්**

| | | |
|---|---|---|
| ක්ෂණික ඇමතුම් අංකය | - | 1911 |
| පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව | - | 0112784208 / 0112784537<br>0112786616 / 0112785922 |

**එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර**
විභාග කොමසාරිස් ජනරාල්

tamilguru.lk